---

# කින්නියා නගර සභාව
# ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 08 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 19 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

### 1.2 මතය

මාගේ පරීක්ෂනයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහිදිලි කිරීම් අනුව කින්නියා නගර සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2012 වර්ෂය තුලදී ආදායම් ඉපැයීම හා සේවා සැපයීම සඳහා එකතුව රු.58,338,860 ක් වූ ස්ථාවර වත්කම් සභාව විසින් භාවිතා කර තිබුණි. නමුත් ස්ථාවර වත්කම් ක්ෂය වීම වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. එබැවින් ආදායම් ඉපැයීම සඳහා දරන ලද වියදම් මූල්‍ය ප්‍රකාශයන්හි පිළිඹිබු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු රු.5,578,066 ක් මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ බැංකු ශේෂය රු.27,816 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන් හි සේවක ණය රු.23,770 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සාවද්‍ය ගණනය කිරීම් හේතුකොට ගෙන හිඟ ආදායම් රු.650,611 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) රු.135,608 ක් වූ විගණන ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.3,593,661 ක් වූ විවිධ ණයගැති ශේෂ වර්ෂ 02 කට අධික කාලයක් නිරවුල් නොකර පැවතුණි.

(ආ) රු.7,378,573 ක් වූ හිඟ ආදායම් අයකර ගැනිම සඳහා වර්ෂ 03 කට අධික කාලයක් තිස්සේ කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

පහත සඳහන් විෂයයන් ඒ එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොතිබීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | සාක්ෂි |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 31,403,838 | ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ හිමිකම් ඔප්පු |
| වාහන | 14,200,006 | ස්ථාවර වත්කම් ලේඛණය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පිරියත් | 4,638,775 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 2,359,487 | විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණ |
| මිශ්‍ර තැන්පතු | 4,000,904 | |

---

| | | |
|---|---|---|
| ණයගැතියෝ | 3,593,661 | සනාථ කිරීම් ලිපි සහ කාල විශ්ලේෂන |

1.3.5 නීති, රීති, සහ රෙගුලාසි වලට අනුකූල නොවීම.

නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| නගර සභා මූල්‍ය රීති | | |
| (අ) අංක 124 | - | රු.116,597 ක් වූ වියදම් වලට අදාල ගෙවීම් වවුචර් වල ශීර්ෂ, උපශීර්ෂ සහ වියදම් සංකේත අංකයන් සඳහන් කර නොතිබුණි. |
| (ආ) අංක 131 | - | රු.276,007 ක් වූ ගෙවීම් වවුචර් 06 ක දිනය, අංක සහ ප්‍රමාණයන් ආදී විස්තර සඳහන් කර නොතිබුණි. |
| (ඇ) අංක 174 | - | 2012 වර්ෂය සඳහා වූ ආදායම් තැන්පතු ලේඛණයෙහි ආරම්භක ශේෂය, ලැබීම් සහ ගෙවීම් සම්බන්ධ සටහන් අසම්පූර්ණ ඒවා විය. |
| (ඈ) අංක 200 | - | ගිණුම් වල වූ ලෙජර් ශේෂයන්හි ප්‍රධාන ලෙජරයට අදාල යොමු සටහන් යොදා නොතිබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,512,834 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,255,561 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තගත ආදායම් තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු සහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් සහ බදු | 1,061 | 303 | 758 |
| (ii) | බදු කුලී | 11,396 | 7,917 | 3,479 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,977 | 3,452 | 525 |
| (iv) | වෙනත් ආදායම් | 3,435 | 1,053 | 2,382 |

---

## 2.3 නිෂ්ක්‍රීය වත්කම්

පහත සඳහන් වත්කම් වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

| වත්කම් විෂයය | මිළදී ගත් දිනය | වටිනාකම රු. | නිෂ්ක්‍රීය කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| සී සෑමේ යන්ත්‍රය | සඳහන් කර නොමැත | 716,000 | වර්ෂ 03 කට අධික |
| සී සෑමේ යන්ත්‍රය (රෝද 2) | 1992 ඔක්තෝබර් | 34,137 | වර්ෂ 05 කට අධික |
| ටිපර් රථය | 2008 ජුනි | 5,098,000 | වර්ෂ 01 |
| සිමෙන්ති මිශ්‍රණ යන්ත්‍රය | සඳහන් කර නොමැත | 300,000 | වර්ෂ 02 |

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ස්ථාවර වත්කම්
(ඈ) ආදායම් රැස්කිරීම